# අපේ ආර්ථිකය ගොඩගන්න පුළුවන්ද?

**ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය පසුගිය 2019 වසරේදී සියයට 3 දක්වා අඩුවීම කැපී පෙනෙන සිදුවීමක් විය. ණය බර ද වැඩිවෙමින් තිබේ. ආර්ථිකය සම්බන්ධව නිර්මාණය වී ඇති මේ අසීරු අවස්ථාවට මුහුණ දී ආර්ථික වර්ධන වේගය ඉහළ නැංවීමට ආණ්ඩුව කළ යුත්තේ කුමක්ද? යන්න ගැන විමසමින් ආචාර්ය ප්‍රියංග දුනුසිංහ මහතා සමග කළ සාකච්ඡාවකින් මේ ලිපිය සැකසිණි.**





කොළඹ විශ්වවිද්‍යාලයේ
ආර්ථික විද්‍යා අධ්‍යනාංශයේ
**ආචාර්ය ප්‍රියංග දුනුසිංහ**

යුද්ධයට පෙර කාලයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 5ත් 6ත් අතර අගයක පැවතිණි. යුද්ධයෙන් පසු කාලය ගත් විට මුල් අවුරුදු කීපයේදී සියයට අටක අගයක ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යෑමට හැකි වුවද ඉන් පසු ආර්ථික වර්ධන වේගය ක්‍රමයෙන් පහළ ගියේය. 2012 න් පසු මේ තත්ත්වය විශේෂයෙන් දැකගත හැකි විය. එම කඩා වැටීමෙහි දරුණුම තත්ත්වය 2019 වසරේදී වාර්තා වූ අතර එවක ආර්ථික වර්ධන වේගය සියයට 3 දක්වා පහත වැටුණි. ඒ සමගම ශ්‍රී ලංකාව, දකුණු ආසියානු කලාපයේ අඩුම ආර්ථික වර්ධන වේගයක් සහිත රටවල් අතර දෙවැනි තැනට පත් වූයේය. අපට ඉදිරියෙන් සිටියේ ඇෆ්ගනිස්ථානයයි.

ආර්ථිකයේ සිදුවූ මේ කඩා වැටීමට බලපෑ හේතු ගැන විවිධ මට්ටමේ සාකච්ඡා, සංවාද මතුවිය. ප්‍රතිපත්ති සම්බන්ධයෙන් තිබූ අවිනිශ්චිතතාව ඒ අතර විශේෂයෙන් සාකච්ඡාවට බඳුන් විය. ඉහළ මට්ටමක තිබූ ණය බර අපනයන අංශයේ කඩා වැටීම, විදේශ ආයෝජන ප්‍රමාණවත් පරිදි නොලැබීම ආදී තත්ත්වයන් ආර්ථික වර්ධන වේගය පහළ යෑම කෙරෙහි බලපෑවේය.

මේ තත්ත්වයට අදාළ වර්තමාන සන්දර්භය නිරීක්ෂණය කිරීමේ දී පෙනී යන්නේ ජනාධිපතිවරණයෙන් පසු බදු බර අඩු කිරීම සඳහා ආණ්ඩුව පියවර රැසක් ගත් බවය. ආර්ථිකයේ ඇතිව තිබූ මන්දගාමීභාවය කෙටිකාලීනව දුරු කිරීම සඳහා ගත් උපක්‍රම හැටියට ඒවා දැක්විය හැකිය. මන්ද එම පියවර ආර්ථිකයේ දිගුකාලීන වර්ධනය සඳහා වැදගත් නොවන බැවිනි.

දිගුකාලීන ආර්ථික වර්ධන වේගයක් සඳහා අවශ්‍ය වෙන්නේ ආයෝජන දිරි ගැන්වීම, ඵලදායීතාව නැංවීම, අපනයන වර්ධනය හා තාක්ෂණ සංවර්ධනය වැනි අංශවල උන්නතිය පිණිස ගන්නා ක්‍රියා මාර්ගයන්ය. ආදායම් බදු හා පොලී අනුපාත පමණක් පහත හෙළීම මගින් ආර්ථිකයට සිදුවූ බලපෑම විග්‍රහ වෙන සංඛ්‍යාත්මක දත්ත තවමත් හඳුනා ගැනීම අසීරුය. මන්දගාමීව පැවැති ආර්ථික ක්‍රියාකාරකම් හොඳ අතට හැරෙමින් පවතින තත්ත්වයක් පමණක් දැනට දිස්වෙයි. කෙසේ වෙතත් එම මන්දගාමීභාවය යළි සක්‍රිය වී තිබේද? නැද්ද? යන්න ගැන නිශ්චිතව ප්‍රකාශ කළ හැක්කේ ආර්ථික සංඛ්‍යා ලේඛන නිකුත් වූ පසු පමණි.

**ආර්ථික සංවර්ධනය කරා යන ගමනක දී අත්හැරිය යුතු අංග ද ඇත. සහනාධාර ලබාදීමේ දී ඒවා අවශ්‍යයෙන්ම ලැබිය යුතු අයට පමණක් ලබාදීමට ආණ්ඩුව පියවර ගත යුතුය. එසේ නොවීමෙන් සිදු වෙන්නේ රජයේ වියදම් ඉහළ යෑමත්, එම වියදම් පිරිමැසීම සඳහා අවශ්‍ය අරමුදල් බදු ඉහළ දැමීම**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කර ඇති ආකාරයට මේ වසරේ දී ලංකාවේ ආර්ථික වර්ධන වේගය සියයට 3.5ත් 4ත් අතර අගයක් දක්වා වර්ධනය වීමට ඉඩ තිබෙයි. මෙරටේ ආර්ථිකය සක්‍රිය වීමට ඉඩ ඇති බව එම අරමුදල පවසයි.

ලංකාවේ ආර්ථික වර්ධන වේගය ඉහළට ගෙන ඒම සඳහා අත්‍යවශ්‍යයෙන්ම කළ යුතු [illegible] ඉතිරි කිරීම හා දේශීය ආයෝජන අතර ඇති පරතරය පියවා ගැනීමට තිබෙන ප්‍රධාන මාර්ගයක් වෙන්නේ ද දේශීය ආයෝජනය. අනික් ක්‍රමය නම් විදේශ ණය ලබා ගැනීමය.

දිගින් දිගටම විදේශ ණය ලබා ගැනීම නිසා ණය බර විශාල ලෙස ඉහළ යෑමත් ඒ මගින් ගෙවුම් ශේෂය හා විදේශ විනිමය අනුපාතය මත ඇති කරන තෙරපුම ඉහළ යෑමත් දැකිය හැකි අතර මේ සියලු තත්ත්ව නිසා ලංකාව ණය ගෙවීමට පවා නොහැකි අසීරු අඩියකට ඇද වැටී ඇත. 'ණය උගුලක' සිරවී සිටින බවට පසුගිය කාලයේදී මේ තත්ත්වය විග්‍රහ විය. මේ වන විටත් ලංකාවේ ණය අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට අසූව ද ඉක්මවන මට්ටමකට පැමිණ තිබෙයි.

මෙවැනි සන්දර්භයක තව දුරටත් ණය ලබාගෙන ආර්ථික කටයුතු සිදු කිරීම ප්‍රඥාගෝචර නොවන අතර විදේශ ආයෝජන දිරිගැන්වීම ඉතාම වැදගත්ය. කොළඹ වරාය නගර ව්‍යාපෘතිය වැනි ආයෝජන ව්‍යාපෘති සඳහා කඩිනමින් විදේශ ආයෝජන ගෙන ඒමට අදළ නීති හා ආයතනික පරිසරය සකස් කිරීම ද අවශ්‍යය.

ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා ශ්‍රම ඵලදායීතාව නැංවීම ද ඉතාමත් වැදගත්ය. රාජ්‍ය අංශයේ වගේම පෞද්ගලික අංශයේද ශ්‍රම ඵලදායීතාව පහළ අගයක පවතින නිසා එය වර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය.

අනෙක් පැත්තෙන් අපනයන දිරි ගැන්වීම සඳහා ක්‍රියා මාර්ග ගැනීම ද අවශ්‍යය. අපනයන දිරි ගැන්වීමකින් තොරව ලංකාව වැනි රටක ආර්ථික වර්ධන වේගය ඉහළ දැමිය හැකි යැයි සිතිය නොහැකිය. මන්ද අපට තිබෙන්නේ කුඩා වෙළෙඳපොළක් නිසා එම වෙළෙඳපොළ සඳහා පමණක් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කර ඉහළ ආර්ථික ප්‍රගතියක් උදාකර ගත නොහැකි නිසාය.

එසේ නම් අප ලෝක වෙළෙඳපොළ සමග බද්ධ විය යුතුය. ඒ සඳහා තිබෙන මාවත් විවෘත කර ගත යුතුය. වෙළෙඳ ගිවිසුම් හෝ ''ශ්‍රී ලංකාව ආයෝජනය සඳහා සුදුසු ස්ථානයක්''ය යන සහතිකය එයින් ලබාදිය හැකිය.

**තව දුරටත් ණය ලබාගෙන ආර්ථික කටයුතු සිදු කිරීම ප්‍රඥාගෝචර නොවන අතර විදේශ ආයෝජන දිරිගැන්වීම ඉතාම වැදගත්ය. කොළඹ වරාය නගර ව්‍යාපෘතිය වැනි ආයෝජන ව්‍යාපෘති සඳහා කඩිනමින් විදේශ ආයෝජන ගෙන ඒමට අදාළ නීති හා ආයතනික පරිසරය සකස් කිරීම ද අවශ්‍යය.**

ආර්ථික සංවර්ධනය කරා යන ගමනක දී අත්හැරිය යුතු අංග ද ඇත. සහනාධාර ලබාදීමේ දී ඒවා අවශ්‍යයෙන්ම ලැබිය යුතු අයට පමණක් ලබාදීමට ආණ්ඩුව පියවර ගත යුතුය. එසේ නොවීමෙන් සිදු වෙන්නේ රජයේ වියදම් ඉහළ යෑමත්, එම වියදම් පිරිමැසීම සඳහා අවශ්‍ය අරමුදල් බදු ඉහළ දැමීම හෝ ණය ලබා ගැනීම මගින් කටයුතු කිරීමට සිදුවීමය. රටේ ණය බර ඉහළ යෑමට මේ තත්ත්වය ද ඉවහල් වෙයි. සහනාධාර ලබා දීමෙහි වැරැද්දක් නැත. නමුත් ඒවා ලැබිය යුතු අයට පමණක් ලබාදිය යුතුය. රජයේ රැකියා ලබාදීමේදී ද මේ ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතුය.

අපේ ආර්ථික ප්‍රතිපත්තිය, දේශීය වෙළෙඳපොළට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ව්‍යවසායකයන් කෙරෙහි